# ගොයම් ගස් මකුණා

පස් මුල්ලක ආකාර හැඩය ඇති ගොයම් මකුණාගේ ජීවිත තොරතුර : සිදි . ම මාගී

මේ කෘමියා වනාහි කුඩාවූ දිග අඟලෙන් 1/3ක් පමණ ඇති දුඹුරුපාටට හුරු කළුවන්වූ, පස්මුල්ලක ආකාර පලිහක්වැනි දෙයකින් ආමාශය දිසාව වැසී ඇති, උරා බොන සත්වයෙකි. ඌට පියාපත් ඇති හෙයින් පියාසර කරන්නට පුළුවන. ගොයම් ගසේ කඳ සිදුරු කර හාරය උරා බොන්නට පුළුවන් වන පරිද්දෙන් තියුණු ලෙස ඌගේ මුඛයේ අවයව සෑදී තිබේ.

ඌ ගොයම් පැලවල හා තණ පඳුරු වල කොළවල දිගට පේළිවල බිත්තර ගොඩ ගොඩවල් වශයෙන් දමයි. මේ කෘමියාගේ බිත්තර රෝස පාටට හුරුය. පීප්පයකට බඳු හැඩහුරු කමින් යුක්තය. දින කීපයකින් බිත්තර බිඳී කළු පුල්ලි සහිත කහවන් දුඹුරු පාටින් යුක්ත වූ මකුණන් රැසක් කලඑලි බසී. කුඩා මකුණන්ට පිහාටු නැති බැවින් ඉගිලෙන්ට බැරිය. මේ කුඩාවෝ ද ඔවුන්ගේ මහවුන් මෙන්ම හොඳ හැටි කඳ හාරා උරාබී සනි 6 කදී පරිපූර්ණ ප්‍රමාණයට වර්ධනය වෙති. මේ කෘමියා වැඩිය කැමැති ගොවි තැන දුම්ල වූ වල් පැල වැඩි තැන්වලටය.

මේ සතුන් ගොයම් ගසේ සාර උරා ගැනීම හේතුකොටගෙන පැලයේ වැඩීම ඇණහිටී. පැලයේ පාට කහවන් වේ. පැලෑටි වයසින් බාල වූ විට මේ සතුන්ගේ ගණන බහුල වුවහොත් පැල සම්පූර්ණයෙන් ම මැරී යන්නටත් පුළුවන. කිරි වදින යුගයේදී බණ්ඩි වලට ද පහර දෙන මේ කෘමීන් නිසා, ධාන්‍ය හිස්ව බොල්ව හැකිලී යන්නටත් පුළුවන. ගොයම් පැල නැති කාලවල මොවුන් යැපෙන්නේ තණකොළ පඳුරු වලින් ය.

පාලනය (1) මේ කෘමීන් විශාල වශයෙන් බෝ වූ විට ලියැදිවල වතුර පුරවා තෙල් දමා ඔවුන් විනාශ කළ හැකිය. වතුර පුරවා භූමිතෙල් ටිකක් ගැල්වූ විට ඔවුන් තෙලට වැටී මියයෙති. තෙලට නොවැටී ඔවුන් කඳන් දිගේ සිටිය හොත් ගොයම් පැල නවා සොලවා ලීමෙන් ඔවුන් දියට වැට්විය හැකිය. සතුන් මිය යෑමෙන් පසු පැලවල ගෑවී ඇති තෙල් හෝදවා හරිනු සඳහා නැවත වරක් හොඳ වතුර පිරවිය යුතුයි. තෙල් ගල්වන්ට අකැමැති නම් ලියැදි වලට වතුර පුරවා සතුන් වතුරට වැටුණු ඉක්බිති දැල්වලින් ඔවුන් අල්ලා විනාශ කළ හැකි ය.

(2) කෘමිනාශක ඖෂධ හා උපකරණ ලබාගත හැකි නම් "ඩී. ඩී. ටී," හෝ "ගැමෙක්සින්" ඉතා යෝග්‍යය. ඒවා කුඩු වශයෙන් හෝ දියර කර යෙදිය හැකිය. සියයට 5 ක් කෘමිනාශක බලය ඇති කුඩු රාත්තල් 25 ක් අක්කරයකට ප්‍රමාණවත් වේ. දියර වශයෙන් සාදතොත් සියයට 50 යේ කුඩු රාත්තලක් වතුර ගැලුම් 10 ක් දමා මිශ්‍ර කරගත් ඖෂධ මිශ්‍රණ ගැලුම් 25 ක් ප්‍රමාණවත් ය.

(3) කුඹුරේ මෙන් ම ඒ වටපිට ද නියර වලද වැවෙන පැල නිසියාකාර මර්දනය කිරීමාදි කෘෂිකම් ක්‍රම විධිමත්ව ක්‍රියාවේ යෙදවීමෙන් මේ කෘමීන් විශාල වශයෙන් බෝ වීම වැලැක් විය හැකිය.

[ප්‍රචාරක පත්‍රිකාවකි]




දරුවන් උදෙසා ආහාර වගා කරන්න !